රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:- 08/2011

මගේ අංකය: එච්/ඩීඅයිඑස්/13 වෙසක්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2011.05. 09

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියළුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**ශ්‍රී බුද්ධ වර්ෂ 2555 වෙසක් උත්සවය සැමරීම.**

ශ්‍රී බුද්ධ වර්ෂ 2555 ක් වූ 2011 වර්ෂයේ මැයි මස 17 හා 18 දෙදින වෙසක් දින වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති අතර, 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සමරන මෙවර වෙසක් උත්සවය වෙනුවෙන් 2011 මැයි මස 14 දින සිට 20 දින දක්වා කාල සීමාව වෙසක් සතිය ලෙස රජය මඟින් ප්‍රකාශයට පත් කර ඇත.

02. එසේම "2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තියට පිළිවෙතින් පෙළ ගැසෙමු" යන තේමා පාඨයද වෙසක් තේමා පාඨය ලෙස රජය විසින් තෝරාගෙන ඇත.

03. එබැවින්, 2011 මැයි මස 14 දින සිට 20 දින දක්වා රජයේ සියළුම ගොඩනැගිලිවල බෞද්ධ කොඩිය ඔසවා තැබීමට හා එම ගොඩනැගිලි ආලෝක කිරීමට ද තීරණය කර තිබේ.

04. ඒ අනුව කටයුතු කරන ලෙස ඔබ යටතේ ඇති සියළුම ආයතනවලට දන්වන මෙන් කාරුණිකව දන්වමි.

පී.බී.අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය

පිටපත්:-

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්